(5)

දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2009

මගේ අංකය ප/2/1/අධ්‍යයන නිවාඩු
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2009.05.15

සියලුම අධ්‍යක්ෂවරුන් වෙත

**ආයතන සංග්‍රහයේ X11 පරිච්ඡේදයේ 16:13 වගන්තිය ප්‍රකාර විදේශ අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු මත නිලධාරීන් මුදා හැරීමේ කාර්ය පරිපාටිය -සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් විදේශ අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු මත මුදා හැරීමේදී ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව අනුගමනය කල යුතු කාර්ය පරිපාටිය පහත දැක්වේ.මේ සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.මෙම චක්‍රලේඛය 2009.05.01 දින සිට බල පැවැත්වේ.

**අදාළ වන නීතිමය විධි විධාන**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 318 -

හා

රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 52/91 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 16 වන වගන්තිය

ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 5 වන වගන්තිය

මේ අනුව විදේශ අධ්‍යයන හෝ රැකියා සඳහා නිලධාරීන් ඉල්ලා සිටින වැටුප් රහිත නිවාඩු නිර්දේශ කිරීමේදී පහත සඳහන් අනිවාර්ය කරුණු කෙරෙහි අවධානය යොමු කල යුතුයි..

01.පත්වීම ස්ථිර කර තිබිය යුතුවේ.(ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16:1)ස්ථිර කරනු නොලැබූ හෝ තාවකාලික, නිලධාරියෙකුට මෙම අනුග්‍රහය අධ්‍යයන කටයුතු සඳහා පමණක් හිමිවේ..

**අධ්‍යයන කටයුතු සඳහා**

01.පිලිගත් ආයතනයක නිත්‍ය පාඨමාලාවක් විය යුතු බව

02.අවශ්‍ය විදේශ විනිමය තමා සතු බව

03. ගිවිසුමකට අත්සන් තැබිය යුතු බව (ආ.සං.9 වන පරිශිෂ්ඨය අනුව'

04 පත්වීමෙහි .ස්ථිර නොකරන ලද නිලධාරියෙකුට ගිවිසුමකට අමතරව රා.ප.ච.ලේ 34/91 න් සංශෝධිත ආ.සං.XV පරිච්ඡේදයේ 4:2 අනුව බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුවේ. (.. XII - ... 16.6 ...)

**රැකියාවක් සඳහා නම්**

01. පත්වීම ස්ථිර කර තිබිය යුතුවේ.

02. ගිවිසුමකට අංතුලත් විය යුතුවේ. . (ආ.සං.10 වන පරිශිෂ්ඨය අනුව)

**මීට අමතරව පහත සඳහන් දෙපාර්තමේන්තු විධිවිධාන කෙරෙහිද අවධානය යොමු කළ යුතුයි.**

01. නිලධාරියා මුල් පත්වීම් දින සිට වැටුප් සහිත අධ්‍යයන නිවාඩු මත හෝ වැටුප් රහිත අධ්‍යයන සහ / හෝ රැකියා සඳහා නිවාඩු ලබා ගෙන ඇති කාල සීමාවන්

02. අයදුම්පත්‍රය ඉදිරිපත් වන අවස්ථාවේ මෙන්ම නිවාඩු අපේක්ෂිත කාලය තුළ එම තනතුරෙහි කාර්යයන් ඉටු කිරීමට පවත්නා කාර්ය මණ්ඩල තත්වය සහ සේවා අවශ්‍යතාවය

03 නිවාඩු කාලය තුළ රාජකාරි ආවරණය සඳහා යොදා ඇති වැඩ පිළිවෙල

04. විනයානුකූල ක්‍රියාවලියක් නොපැවැත්වෙන බව හෝ ආරම්භ කිරීමට නියමිතව නොමැති බව..

05. මේ දක්වා අත්සන් කර ඇති ඇප බැඳුම්කරවලින් නිදහස් විය යුතු බව

06. විගණන විමසුම්වලින් හෝ දෙපාර්තමේන්තු විනය පරීක්ෂණවලින් අයවීමට මුදලක් නොමැති වීම

07. වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හෝ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සහ / හෝ රැකියා සඳහා දිවයිනෙන් බැහැරව ගිය නිලධාරීන් ඔවුන්ගේ ගිවිසුම් ගත අනිවාර්ය සේවා කාලය නිම කොට තිබීම.

08. නිලධාරියාගෙන් රජයට අයවිය යුතු සියළුම මුදල් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3:18 අනුව සම්පූර්ණයෙන් ගෙවා තිබීම

09. නිවාඩු අවසන්වී සේවයට වාර්තා කල පසු දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත පුරප්පාඩු ඇති ඕනෑම සේවා ස්ථානයකට (පළාත් රාජ්‍ය සේවාවද ඇතුලුව)අනුයුක්ත වීමට කෙරෙන එකඟත්වය පළ කිරීම

**අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි**

01. නියමිත පරිදි සම්පූර්ණ කළ පොදු 126 අයදුම්පත්‍රය

02. අධ්‍යයන පාඨමාලා / රැකියා සඳහා නිලධාරියා තෝරා ගෙන ඇති බවට පිළිගත හැකි ලිඛිත සාක්ෂි

03. නිවාඩු අපේක්ෂිත කාල සීමාව අධ්‍යයන පාඨමාලාව/රැකියාව සඳහා අවශ්‍ය කාල සීමාව බව සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි

04. ඉහත සඳහන් ඡේදවල සියළු කරුණු සලකා බලා ඉදිරිපත් කරනු ලබන අංශ/ ඒකක ප්‍රධානියාගේ නිර්දේශය

නිවාඩු අනුමත කරන බලධාරියා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වේ.

## නිවාඩු අනුමැතිය ලද පසු ක්‍රියා කළ යුතු පිළිවෙල

01. අනුමැතිය ලද බව දැනුම් දීම.
02. අදාල ගිවිසුම / බැදුම්කර නිළධාරියා ලවා අත්සන් කරවා ගැනීම
03. අධ්‍යයනය සඳහා නම් 9 වන පරිශිෂ්ඨයේ සඳහන් පරිදිද රැකියාවක් සඳහා නම් 10 වන පරිශිෂ්ඨයේ පරිදිද ගිවිසුමකට එළඹිය යුතුය.එම කාර්යයන් දෙකම සඳහා නම් 11 වන පරිශිෂ්ඨය පරිදි ගිවිසුමකට එළඹිය යුතුයි.
04. දිවයිනෙන් බැහැරව යන දිනය හා ආපසු පැමිණෙන දිනය දන්වා එවීමට සටහන් කර ගන්නා ලෙස දැනුම් දීම.
05. එම කාල සීමාව තුළ වැටුප් නොගෙවන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත දන්වා යැවීම
06. නිවාඩු අනුමත වූ පසු ඒ බැව් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම
07. නිල නිවාසයක පදිංචිව සිටි නම් එයද , රජයට අයත් බඩු බාහිරාදිය හා ලිපි ලේඛනද අංශ ප්‍රධානියා විසින් බලය පවරන නිලධාරියෙකු වෙත විධිමත් පරිදි භාර දී භාර දීම
08. වැටුප් රහිත නිවාඩු ලබා දීම සඳහා ඉහත සියලු අවශ්‍යතා ඉටු කල බවට සහතිකයක් අංශ ප්‍රධානියාගෙන් ලබා ගැනීම.

එච්.එම්.එස්.පී.හේරත්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

o/c

පිටපත -ලේකම්,පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය කාරුණික දැන ගැනීම සඳහා